# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site


---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/01/12/observation

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2017.04.28

සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් / සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**<u>වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය සඳහා වැවිලි අධීක්ෂණ නිලධාරීන් ලෙස සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම.</u>**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින වැවිලි අධීක්ෂණ නිලධාරී තනතුරු 24 ක් දැනට සංවර්ධන නිලධාරී සේවයේ නියුතු නිලධාරීන් වෙතින් සම්පූර්ණ කිරීමට අංක අමප 17/0478/726/008 හා 2017.04.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව රාජ්‍ය සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් අතුරින් කෘෂිකර්මය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ඇති උපාධිධාරීන් පිළිබඳ සමාලෝචනයක් සිදු කොට ඔවුන් වැවිලි අධීක්ෂණ නිලධාරීන් ලෙස සේවයේ යෙදවීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය වී ඇත.

එබැවින් කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි ආයතන වලට අනුයුක්තව සේවය කරන ඉහත විෂය ක්ෂේත්‍රයන්ට අදාලව උපාධි හදාරා ඇති සංවර්ධන නිලධාරීන් පිළිබඳ තොරතුරු ලබා ගත යුතුව ඇති බැවින් පහත ආකෘති පත්‍රය ප්‍රකාරව එම තොරතුරු සම්පූර්ණ කර පහත ලිපිනයට හෝ adcs.pubad@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය වෙත **2017.05.15** ට ප්‍රථම යොමු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

| නම | හැඳුනුම්පත් අංකය | ලිපිනය | දුරකථන අංකය | ලබා ඇති උපාධිය | විෂය ක්ෂේත්‍රය | අදාල තනතුරට තෝරා ගතහොත් නිදහස් කල හැකිය / නොහැකිය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**අධ්‍යක්ෂ (සංවර්ධන නිළධාරී ශාඛාව)**
**ඒකාබද්ධ සේවා අංශය**
**රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**
**නිදහස් චතුරශ්‍රය**
**කොළඹ 07**

**කේ.වී.පී.එම්.ජේ ගමගේ**

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**